# තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව

එම්.කෝරලගේ,
චාන්දනී බේකරිය, ඇතුල්මල්පිටිය,
පොළොන්නරුව.

අභියාචක

**අභියාචනා අංකය : 829/2021** එදිරිව

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව,
සෙත්සිරිපාය 1 - අදියර, 4 වන මහල,
බත්තරමුල්ල.

පොදු අධිකාරිය

**ඉදිරිපිටදී** : 1. විනිසුරු උපාලි අබේරත්න (විශ්‍රාමික) - සභාපති
2. නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන - කොමසාරිස්
3. නීතිඥ ජගත් ලියන ආරච්චි - කොමසාරිස්

**පෙනී සිටීම** : අභියාචක නැත.
පොදු අධිකාරිය වෙනුවෙන් සූම් තාක්ෂණය ඔස්සේ අධ්‍යක්ෂ (පාලන) රමණී දන්තිකා පුංචිවෙඩික්කාර මිය සම්බන්ධ වේ.

**ලිඛිත සැළකිරීම්** : අභියාචක - ඉදිරිපත් කර නොමැත.
පොදු අධිකාරිය - ඉදිරිපත් කර නොමැත.

**විභාග කළ දිනය** : 2022.05.31, 2022.08.22

**තීරණය කළ දිනය** : 2022.08.22

**කොමිෂන් සභාවේ තීරණය :**

**අභියාචනයට පසුබිම් වූ කරුණු**

අභියාචක විසින් 2021.04.19 දිනැති තොරතුරු ඉල්ලීම මඟින් පහත සඳහන් තොරතුරු ඉල්ලා ඇත.

> *"ඔබ ආයතනය සඳහා මේ වන විට තොරතුරු නිළධාරියෙක් පත්කර ඇත්ද? යන්න තොරතුරු ලබා දෙන්න"*

තොරතුරු නිලධාරි පනත ප්‍රකාරව, නියමිත කාලය තුළ පිළිතුරු සැපයීමට අපොහොසත් වූ බැවින් අභියාචක විසින් 2021.05.18 දිනැතිව නම්කළ නිලධාරි වෙත අභියාචනයක් යොමු කර ඇත. නම්කළ නිලධාරි ද පනත

ප්‍රකාරව, නියමිත කාලය තුළ ප්‍රතිචාර දැක්වීමට අපොහොසත් වූ බැවින් අභියාචක විසින් 2021.08.05 දිනැතිව කොමිෂන් සභාව වෙත ඉහත අංක දරණ අභියාචනය යොමු කර ඇත.

අභියාචකගේ 2021.04.19 දිනැති තොරතුරු ඉල්ලීමට සහ 2021.05.18 දිනැති අභියාචනයට ප්‍රතිචාර දැක්වීමට පොදු අධිකාරිය අපොහොසත් වී ඇති බව කොමිෂන් සභාව නිරීක්ෂණය කර ඇත. ඒ අනුව, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතෙහි විධිවිධානවලට අනුකූලව, පනත මගින් නිශ්චිතව දක්වා ඇති කාල නියමයන් තුළ පුරවැසියන් විසින් ඉදිරිපත් කරනු ලබන සියලු තොරතුරු ඉල්ලීම් සහ අභියාචනා සඳහා ප්‍රතිචාර දැක්වීමට, පනතෙහි 24 (3) සහ 25 (1) වගන්ති ප්‍රකාරව පොදු අධිකාරියේ තොරතුරු නිලධාරි හට ද, පනතෙහි 31(2) සහ 31(3) වගන්ති ප්‍රකාරව නම්කළ නිලධාරි හට ද පැවරී ඇති ව්‍යවස්ථාපිත වගකීම පොදු අධිකාරියේ තොරතුරු නිළධාරි සහ නම්කළ නිළධාරි විසින් පැහැර හැර ඇති බව කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කර ඇත.

**සලකා බැලීම**

පොදු අධිකාරියේ තොරතුරු නිලධාරින්ගේ තොරතුරු සහ නම් කළ නිලධාරිගේ තොරතුරු තවමත් පොදු අධිකාරියේ වෙබ් අඩවියෙහි ඇතුළත් කර නොමැති බවට අද දින පරීක්ෂණයට සහභාගි වන පොදු අධිකාරියේ අධ්‍යක්ෂ (පාලන) රමණී දන්තිකා පුංචිවෙඩික්කාර මිය ප්‍රකාශ කරයි.

මේ අනුව පොදු අධිකාරිය 2016 අංක 12 දරණ තොරතුරු පනතේ විධිවිධාන නිසි පරිදි අනුගමනය නොකරන බව පැහැදිලිව පෙනී යයි. එබැවින්, 2022.08.29 වන දිනට ප්‍රථම, පොදු අධිකාරියේ වෙබ් අඩවිය යාවත්කාලින කර, ඉහත සඳහන් තොරතුරු ඉල්ලීමෙන් ඉල්ලා ඇති සියලුම තොරතුරු, මෙම කොමිෂන් සභාවටද පිටපත් සහිතව, අභියාචක වෙත මුදා හැරීමට පොදු අධිකාරිය ක්‍රියා කළ යුතු බවට තීරණය කරමු.

එසේ තොරතුරු ලබා දීමට පොදු අධිකාරිය අපොහොසත් වන්නේ නම් තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 39 වගන්තිය ප්‍රකාරව පොදු අධිකාරියට සහ තොරතුරු නිලධාරිට එරෙහිව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පැවරිය යුතු බවටද වැඩිදුරටත් තීරණය කරමු.

මෙම තීරණය පොදු අධිකාරිය, තොරතුරු නිලධාරි සහ අභියාචක වෙත දැනුම් දීමට මෙම කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජෙනරාල්වරයා මෙහෙයවනු ලැබේ.

අභියාචනය අවසන් කරන ලදී.